Article 12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 - 10 - 17

පැමිණිලිකරු : එම්.එම්. තරිඳු චමීර මයා,
"සුපුන්"
මාර්ලොප් පාර, ගල්වල,
බණ්ඩාරවෙල.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
බ/බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය,
බණ්ඩාරවෙල.

02. විදුහල්පති,
(අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපති)
බ/බදුල්ල විශාඛා බාලිකා විද්‍යාලය,
බදුල්ල.

03. ජාතික පාසැල් අධ්‍යක්ෂ,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/BD/04/19**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, ඩී.එම් එවින්දි නිමලිනී නැමති තම දියණිය බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ 2019 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගැනීම සඳහා බ/ ආදි ශිෂ්‍ය ගණය සහ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය සහ සහෝදර ගණය යටතේ අයදුම්පත් යොමුකළ බවත්, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ආදි ශිෂ්‍ය ගණය යටතේ සහභාගී වී පාසල විසින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රථම තාවකාලික ලැයිස්තුවේ අනු අංක 32 යටතේ තමාගේ දියණියගේ නම ඇතුළත්ව තිබූ බවත්, එම ලේඛනයට අනුව



1

දියණිය පාසලට තේරී පත්ව සිටි නමුත් තම දියණියගේ නම අවසාන ලේඛනයේ නොතිබූ බවත්, එසේ හෙයින් දියණියට පාසැලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වූ බවත් සඳහන් කර ඇත.

මෙසේ සිදුවූයේ අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 24/2018 චක්‍රලේඛයේ ක්‍රියාපටිපාටි නොසලකා සාවද්‍ය ලෙස වෙනත් අයට ලකුණු ලබා දී ඇති බව තමාගේ අදහස වන බවත්, එම හේතුව මත තම දියණිය එම පාසලට ඇතුළත් කර නොගැනීමෙන් අසාධාරණයක් වූ බවත්, ඒ පිළිබඳව සොයා බලා තම දියණියට බ/ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ 01 ශ්‍රේණියට ඇතුළත් වීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත.

වගඋත්තර පාර්ශවයන්ගේ සැළකර සිටීම :-

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින්, බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් දන්වා ඇත්තේ, මෙම පැමිණිලි පාර්ශවයේ දියණිය මුල් සම්මුඛ පරීක්ෂණයේදී ආදි ශිෂ්‍ය පදනමින් ලකුණු 61 ක් ලබාගෙන තාවකාලික ලේඛනයේ 32 වන ස්ථානයේ ස්ථාන ගත කර තිබූ බවත්, නමුත් අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසු ආසන්න ගණය යටතේ ආදි ශිෂ්‍ය දෙමාපියන්ට ලබා දී තිබූ ලකුණු අඩුවීම නිසා එම ආදි ශිෂ්‍යයන්ගේ ඉල්ලීම අනුව ආදි ශිෂ්‍ය පදනමින් වැඩි ලකුණු ලබා සිටි දෙමාපියන්ගේ දරුවන් නැවත ආදි ශිෂ්‍ය පදනම යටතේ ලේඛනගත කර ස්ථාන ගත කරන ලද බවත්, එම ස්ථානගත කිරීම නිසා මෙම පැමිණිලි පාර්ශවයන්ගේ දරුවාගේ නම පාසලට ඇතුළත් කර ගැනීමේ අවසාන ලේඛනයෙන් ඉවත් වූ බවත්, එම දියණියගේ නම අවසාන ලේඛනයෙන් පොරොත්තු ලේඛනයට පළමු ස්ථානයේ ස්ථානගත වූ බවත්ය.

දෙවැනි වගඋත්තරකාර අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපති විසින් සඳහන් කර ඇත්තේ, ආදි ශිෂ්‍ය ගණය යටතේ විරෝධතා ඉදිරිපත් කර තිබූ අය විසින් සිය විරෝධතා එල්ල කර ඇති පස් දෙනකු නම් ඉවත් කර ගත් බවත්, එම පස් දෙනා අතර මෙම පැමිණිලිකරුද සිටින බවත්, එම අවස්ථාවේ විරෝධතාවය ඉවත් කරගත් බවට එම අයදුම්කරුවන් පස්දෙනා දැනුවත් කරන ලද බවත්, අවසන් ලැයිස්තුව සකස් කිරීමේදී මෙම පැමිණිලිකරුගේ නම ඉවත්වී ඇති බව ඔහු තමා හමුවේ ප්‍රකාශ කළ බවත්, ඔහුගේ ලකුණු නැවත සලකා බැලීමක් කරන බවට බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ප්‍රකාශ කළ බවත්, අභියාචනා විරෝධතා මණ්ඩල කැඳවීමේ වගකීමක් තමා සතුව නොමැති බවත්ය.

පැමිණිල්ලේ විරෝධතා :-

පැමිණිලි පාර්ශවය වගඋත්තර පාර්ශවයන්ගේ වාර්තා සඳහා සිය විරෝධතා ඉදිරිපත් කරමින්, තමන් වගඋත්තර පාර්ශවයන්ගේ වාර්තා සමඟ සෑහීමකට පත් නොවන බවත්, පළමු වගඋත්තරකාර

බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් පවසන පරිදි ආසන්න පදිංචිකරුවන්ගේ ගණයෙන් ඉවත් වූ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් නැවත ආදි ශිෂ්‍ය ගණය යටතේ ඇතුළත් කිරීම නිසා තමාගේ දියණියගේ නම පොරොත්තු ලේඛනයට ඇතුළත් වූ බව දන්වා ඇති නමුත් සත්‍ය වශයෙන්ම එසේ ආසන්න පදිංචිකරුවන්ගේ ගණයෙන් ඉවත් වී අවසාන ලේඛනයේ ආදි ශිෂ්‍ය ගණයට ඇතුළත් වන්නේ ආර්.එම්.එස්.එම් රත්නායක යන අයගේ දරුවාගේ නම පමණක් බවද දක්වා ඇත.

එසේම දෙවන වගඋත්තරකාර අභියාචනා හා විරෝධතා මණ්ඩල සභාපතිතුමිය තමා 2018.12.26 අභියාචනා අවස්ථාවට සහභාගී නොවූ බවට කරන ලද කරුණු දැක්වීමට ලෙසටම තමා 2018.12.26 දින පැවැති අභියාචන පරීක්ෂණ වලට සහභාගී නොවූ බවත්, එයට හේතුව චක්‍රලේඛයේ පරිදි තමා අභියාචනයක් දැමීම හෝ අභියාචනා අවස්ථාවට සහභාගී වීම අවශ්‍ය නොවීම මත බවත්ය. මක්නිසාද යත් තමාගේ දියණියගේ නම තාවකාලික ලේඛනයේ ඇතුළත්ව තිබීමත්, චක්‍රලේඛයේ 12:1:2 වගන්තිය පරිදි තාවකාලික ලේඛනයේ තිබූ යම් දරුවකුගේ නම අවසාන ලේඛනයෙන් ඉවත් වන්නේ එම දරුවාගේ දෙමාපියන් නැවත අභියාචනා මණ්ඩලයට කැඳවා නැවත සුදුසුකම් පරීක්ෂා කළයුතු බැවින් තමාට එම අවස්ථාව හිමිවිය යුතු බව දන්නා නිසා බවත් සඳහන් කර ඇත.

නමුත් අභියාචනා හා විරෝධතා මණ්ඩලයේදී අන් අයගේ ලකුණු වැඩි වූ බව දැනගත් පසුව තමාගේ දියණියගේ නම අවසාන ලේඛනයෙන් ඉවත් වීමට ඉඩ ඇති බැවින් තමාගේ අභියාචනය නැවත සලකා බලන ලෙසත් චක්‍රලේඛයේ 12:1:2 සඳහන් අවස්ථාව තමාට ලබාදෙන ලෙසත් 2018.12.06 දින ලිඛිතව අභියාචනා හා විරෝධතා මණ්ඩල සභාපතිතුමියගෙන් ඉල්ලා සිටි බවත්, නැවත නැවතත් අවස්ථා කිහිපයකදී ලිඛිතව හා වාචිකව තමා හට එම අවස්ථාව සලසා දෙන ලෙස පළමු හා දෙවන වගඋත්තර පාර්ශවයන්ගේ ඉල්ලීම් කළද අවස්ථාව නොලැබුනු බවත්, මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසත් ඉල්ලා ඇත.

අනතුරුව කොමිෂන් සභාව විසින් පළමු වගඋත්තර පාර්ශවය කැඳවා ඇති අතර, එහිදී පැමිණිල්ලට අදාළ සවිස්තර පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලෙසට එම පාර්ශවයට දන්වා ඇත.

වගඋත්තර පාර්ශවීය වැඩිදුර කරුණු :-

ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් සවිස්තර වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින්, පැමිණිලිකරුගේ දියණිය වන ඩී.එම්. එච්න්දි නිම්ලිනි 2019 වර්ෂයේ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කළ ලේඛන හා සහතික අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු 61 ක් ලබා දී ඇති බවත්, එම ගණය යටතේ ලකුණු ලබාගෙන ඇති පිළිවෙල අනුව ලකුණු 61 ක් ලබා ගත් මෙම පැමිණිලිකරුගේ දියණියගේ නම තාවකාලික ලේඛනයේ 32 වන ස්ථානයට ස්ථාන ගත කර එම ලේඛනය 2018.10.11 වන දින ප්‍රදර්ශනය කළ

බවත්ය. මෙම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට ප්‍රථම 2018.07.29 දින අයදුම්පත් පාසැල වෙත එවා තිබූ සියළු ගණ අනුව සියලුම අයදුම්කරුවන් රැස්කර අධ්‍යාපන ලේකම් විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 28/2018 චක්‍ර ලේඛනයට අනුව ලකුණු ලබාදෙන ආකාරය සියළු දෙනාටම පැහැදිලි කර දී ඇති බවද දක්වා ඇත.

ආදි ශිෂ්‍ය පදනම අනුව ලකුණු ලබාදීමේ චක්‍රලේඛයේ 7:35 වගන්තිය අනුව ලකුණු ලබාදෙන ආකාරය පිළිබඳ ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයින් හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් සාකච්ඡා කර ලකුණු ලබාදෙන ආකාරය සකස් කර දැනුවත් කරන ලද බවත්, ආදි ශිෂ්‍ය පදනම අනුව තාවකාලික ලේඛනය අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් 32කු ඇතුළත් කිරීමට තෝරාගත් අතර 32 වන ස්ථානය මෙම අයගේ දියණිය ඇතුළත් කිරීමට තෝරාගෙන තිබූ බවත් නමුත් තාවකාලික ලේඛනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු ඒ ඒ ගණ අනුව අභියාචනා හා විරෝධතා රාශියක් ඉදිරිපත් වී තිබූ බවත්, අභියාචනා හා විරෝධතා මණ්ඩලය 2018.11.26 හා 2018.12.06 දෙදින රැස්වී අභියාචනා හා විරෝධතා විභාග කර අවසාන ලැයිස්තුව සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බවත්, මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණවලදී ඉහළ ලකුණු ලබාගෙන සිටි ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාසැලට ආසන්න පදනම අනුව ලකුණු අඩු වූ බැවින් එම අය ආදි ශිෂ්‍ය පදනම අනුව ඉහළ ලකුණු ලබා සිටි නිසා නැවත ආදි ශිෂ්‍ය පදනම අනුව ළමුන් ඇතුළත් කිරීමට එම ගණය යටතේ නම් ඇතුළත් කරන ලද බවත් සඳහන් කර ඇත.

තාවකාලික ලේඛනය සකස් කිරීමේදී ලකුණු 76 ක් ලබාගෙන තිබූ ආර්.එම් සස්විඳ දරුවාගේ නම ලේඛනයට ඇතුළත් නොවී තිබූ අතර අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කර තිබූ අභියාචනා සලකා බලා එම නමද ඇතුළත් කර ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා/විරෝධතා පරීක්ෂණ මණ්ඩලය සඳහා පාසැල් සංවර්ධන සමිතියේ කමිටු රැස්වීමේ හා ආදි ශිෂ්‍ය සංගමයේ කළමණාකරණ රැස්වීමේ හා එහ නියෝජිතයින් පත්කර තමා වෙත දන්වා සිටීමෙන් පසු ඒ අය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද බවත් සඳහන් කර ඇත.

අභියාචනා විරෝධතා පරීක්ෂණයෙන් පසු තාවකාලික ලේඛනයෙන් ඇතුළත් කිරීමට තේරී පත්වූ දරුවකු ඉන් ඉවත් වී ඇත්නම් චක්‍රලේඛයේ 12:1:2 වගන්තිය අනුව ඩී.එම් තරිදූ වජිර යන අයගේ දරුවා සඳහා ලබා දී තිබූ ලකුණු නිවැරදි දැයි විමසා බැලීම සඳහා 2018.12.15 දින නැවත කැඳවා පරීක්ෂා කරන ලද බවත්, ඒ අනුව එම ලකුණු ප්‍රමාණය වෙනස් නොවන බව තමා වෙත දන්වන ලද බවත්, මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසු ස්ථිර ලේඛනය සකස් කිරීමේදී ඉහත සඳහන් දරුවා පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයට ස්ථාන ගත කර ඇති බවත්, පැමිණිල්ල විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය වෙත ඇති චෝදනා සඳහා තමාට පිළිතුරු ලබාදිය නොහැකි බවත් දන්වා ඇත.

චක්‍රලේඛ ප්‍රකාරව විනිවිධභාවයකින් යුක්තව මුල් සම්මුඛ පරීක්ෂණය සිදු කරන ලද බවත්, එහිදී මෙම පැමිණිලි පාර්ශවයට අගතියක් වූයේ නම් සිදුකිරීමට තිබුනේ අභියාචනයක් හෝ විරෝධතාවයක් ලිඛිතව ඉදිරිපත් කර එම පරීක්ෂණයට ඉදිරිපත් වීම බවත්, නමුත් එම මහතා එවැනි පරීක්ෂණයකට ඉදිරිපත් වී නොමැති බවත් පැමිණිලි පාර්ශවය විසින් තමා වෙත ඉදිරිපත් කර ඇති සියළු චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් වගඋත්තර පාර්ශවය සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත.

මේ අනුව පාර්ශවයන් නැවත කොමිෂන් සභාව වෙත කැඳවා 2019 වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය පදනමින් පාසලට ඇතුළත් කර ගත් දරුවන්ගේ ගොනු සියල්ල පරීක්ෂාවට ලක්කර ඇත.

මෙහිදී එකී ආදි ශිෂ්‍ය පදනමින් පාසලට ඇතුළත් වූ දරුවන්ගේ ගොනු ආශ්‍රයෙන් නිවැරදි නොවන ලෙස ලකුණු ලබා දී ඇති බවට පැමිණිලි පාර්ශවය පෙන්වා දෙන ලද ගොනු පිළිබඳව වගඋත්තර පාර්ශවයන්ගෙන් කරුණු විමසා ඇත. එකී ගොනු විස්තර හා පැමිණිලි පාර්ශවය පෙන්වා දෙන කරුණු හා ඒවාට වගඋත්තර පාර්ශවය ලබාදුන් පිළිතුරු පහත දක්වා ඇත.

ගොනු අංක **OB 62** පරීක්ෂා කිරීමේදී අනාවරණය වී ඇති කරුණු -

මෙම ගොනුවට අනුව අදාළ ලකුණු ලබාදීමේ ලේඛනයේ (03 වන කරුණ යටතේ) පාසැල් කාලය තුළ සමගාමී විෂය බාහිර ජයග්‍රහණ සඳහා ලකුණු 11 ක් ලබා දීම ගැටළු සහගත වන බවත්, (04 වන කරුණ යටතේ) ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය පාසැලේ දියුණුවට දුන් විවිධ සහයෝග සහ පාසල් කාලයෙන් පසු අධ්‍යාපන ජයග්‍රහණ සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 21 ක් ලබාදුන් නමුත් අභියාචනා හා විරෝධතා මණ්ඩලයේදී ඒ සඳහා ලකුණු දෙකක් වැඩි වී එය ලකුණු 23 ක් වීම ගැටළු සහගත වන බවටත් පැමිණිලි පාර්ශවය විසින් දන්වා ඇත.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පාසල්කාලය තුළ සමගාමී විෂය බාහිර ජයග්‍රහණ සඳහා ලකුණු 11 ක් ලබා දීම නිවැරදි බවත්, එසේම ආදි ශිෂ්‍ය ගමයේ සාමාජිකත්වය, පාසැල් දියුණුවට දුන් විවිධ සහයෝග, පාසැල් කාලයෙන් පසු අධ්‍යාපන ජයග්‍රහණ සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 21 ක් ලබාදුන් නමුත් අභියාචනා හා විරෝධතා මණ්ඩලයේදී ඒ සඳහා ලකුණු දෙකක් වැඩි වී එය ලකුණු 23 ක් වීම ගැටළු සහගත බව නිවැරදි බවත්ය. එසේ වන්නේ එම අයදුම්කරු තමාට පශ්චාත් උපාධි සහතිකයක් තිබෙන බව දන්වා තිබීම වන නමුත් ගොනුවේ එවැනි සහතිකයක් නොමැති වීම නිරීක්ෂණය වූ බවත් වගඋත්තර පාර්ශවය පිළිගෙන ඇත.

ගොනු අංක **OB** පරීක්ෂා කිරීමේදී අනාවරණය වී ඇති කරුණු -

ඉහත අයදුම්පත සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවයේ ගැටළුව වන්නේ අදාළ ලකුණු ලබා දීමේ ලේඛනයේ 2 වන කරුණ යටතේ දක්වා ඇති පාසල් කාලය තුළ අධ්‍යාපන ජයග්‍රහන වලදී එම අයට

05 වසර ශිෂ්‍යත්ව සමත් බවට සහතිකයක් ඉදිරිපත් කර නොමැති නමුත් ඊට ලකුණු ලබා දීම කර ඇති බැවින් එය ප්‍රශ්නගත බවත් දක්වා ඇත.

ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, අදාළ අභියාචනා මණ්ඩලයේදී එහි සාමාජිකව සිටි බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් මෙම අයදුම්කරු 05 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් අයෙක් බව තමන් දන්නා බවත් , එමෙන්ම එම සහතිකය ඔහු හට ලබා දීම පාසලෙන් ප්‍රමාද වී ඇති බව දැන්වූ බවත්, ඒ අනුව ඔහු හට එම ලකුණු ලබා දුන් බවත් ප්‍රකාශ කර ඇත. නමුත් මේ වන තෙක් අදාළ සහතිකය එම ගොනුවේ නොමැති බවට කොමිසමට නිරීක්ෂණය විය.

ගොනු අංක **OB** 13 පරීක්ෂා කිරීමේදී අනාවරණය වී ඇති කරුණු -

මෙම අයදුම්පත සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවයේ ගැටළුව ලෙස දක්වා ඇත්තේ, ලකුණු ලබා දීමේ ලේඛනයේ 01 වන කරුණ යටතේ පාසැලේ ඉගෙනුම ලැබූ කාලයට ලබා දී ඇති ලකුණු 16 වැරදි බවත්, එම අයදුම්කරු 7 ශ්‍රේණියේ සිට අධ්‍යාපනය ලැබූ හෙයින් එම ලකුණු චක්‍ර ලේඛ ප්‍රකාරව ලකුණු 14 පමණක් විය යුතු බවත්ය.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, මෙම අයදුම්කරු 13 ශ්‍රේණියේදී දෙවරක් විභාගයට මුහුණ දී ඇති බැවින් එම ලකුණු ලබා දී ඇති බවයි. මෙහිදී කොමිසම පෙන්වා දෙනු ලැබුයේ අදාළ චක්‍රලේඛයේදී 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා එක් ශ්‍රේණියකට ලකුණු 02 බැගින් ඒ සඳහා උපරිම ලකුණු 26 ක් පමණක් ලබා දෙන බවත්, ඒ අනුව 13 ශ්‍රේණියේ දෙවන වර සිටීමට ලකුණු 02 ක් ලබාදිය නොහැකි බවයි.

ගොනු අංක **OB** 41/ **OB** 42 / **OB** 43 පරීක්ෂා කිරීමේදී අනාවරණය වී ඇති කරුණු -

මෙහිදී පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, ලකුණු ලබා දීමේ ලේඛනයේ 03 වන කරුණ යටතේ පාසල් කාලය තුළ විෂය සමගාමී හා විෂය බාහිර ජයග්‍රහණ සඳහා ලකුණු 07 ක් හා 04 වන කරුණ යටතේ ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජකත්වය, පාසල් දියුණුවට දුන් සහයෝග, පාසල් කාලයෙන් පසු අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ලකුණු 22 ක් ලබා දී ඇතත්, ඊට අදාළව කිසිදු ලේඛනයක් එම අයදුම්කරු ඉදිරිපත් කර නොමැති බවත් ලේඛන නොමැතිව එම ලකුණු ලබාදීම ගැටළු සහගත බවත්ය.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ, මෙම ගොනු තුනම තුන් නිවුන් දරුවන් සඳහා අදාළ වන බවත්, මෙම පැමිණිලිකරු දක්වන අන්දමට 03 වන සහ 04 වන කරුණු වලට අදාළව කිසිදු ලියවිල්ලක් අයදුම්කරුවන් ඉදිරිපත් කර නොමැති බව ගොනු ආශ්‍රයෙන් නිරීක්ෂණය වන බව සත්‍ය බවත්, නමුත් ඒ සඳහා කිසිදු විරෝධතාවයක් ඉදිරිපත්ව නොතිබූ බවත්ය.

මෙහිදී පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, එම ගොනුවල අවශ්‍ය ලේඛන නොමැති බව මෙම විමසුමේදී අනාවරණය වුවද ඊට ප්‍රථම අනෙක් අයදුම්කරුවන් මේ සඳහා විරෝධතා ඉදිරිපත් කර නොමැත්තේ එසේ ගොනුවලට ලේඛන නොමැති බව ඔවුන් නොදන්නා හෙයින් බවයි. එසේ නොදන්නා බව හේතුවෙන් විරෝධතා ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බවද සඳහන් කර ඇත.

**OB 21 පරීක්ෂා කිරීමේදී අනාවරණය වී ඇති කරුණු -**

මෙහිදී ලකුණු ලබා දීමේ ලේඛනයේ 03 වන කරුණ යටතේ පාසල් කාලය තුළ විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු 13 ක් ලබා දීම ගැටළු සහගත බවත්, ලකුණු ලබා දීමේ ලේඛනයේ 02 වන කරුණ යටතේ පාසල් කාලය තුළ ලද අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ලකුණු 18 ක් ලබාදීම ගැටළු සහගත බව එනම්, එම අයදුම්කරු තෙවන වර උසස්පෙළ විභාගයට මුහුණ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබාගත් අයෙක් වන හෙයින් තෙවන වර උසස් පෙළ විභාග ප්‍රතිඵල සහතිකයට ලකුණු ලබා දීම ගැටළු සහගත බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම වී ඇත්තේ, මෙම ගොනුවට ඉදිරිපත් වී ඇති ලේඛන අනුව 03 වන කරුණ සඳහා ලබාදිය හැක්කේ ලකුණු 09 ක් පමණක් බවයි. ඒ අනුව ඉන් ලකුණු 04 ක් අඩුවිය යුතු බවට දෙවන වගඋත්තර පාර්ශවය පිළිගන්නා ලදී.

02 වන කරුණ සඳහා ලකුණු ලබාදුන් ආකාරය පිළිබඳව විමසීම් කිරීමේදී වගඋත්තර පාර්ශවය පිළිතුරු බැඳීමක් කර නොමැති අතර, කොමිෂන් සභාව විසින් අදාළ අයදුම්කරු තෙවන වර උසස් පෙළ සමත් වූ සහතිකයට ලකුණු ලබාදී ඇති බවත්, තෙවන වර විභාගයට පෙනී සිටින්නේ බාහිර අයදුම්කරුවෙකු ලෙසින් වන හෙයින් එම සහතිකයට පාසැල් කාලය තුළ ලබාගත් ජයග්‍රහන ලෙස සලකා ලකුණු ලබාදිය නොහැකි බවත් පෙන්වා දී ඇත.

මෙහිදී මෙම පැමිණිලි පාර්ශවයේ ගොනුව පිළිබඳව විමසීම් කරන විට පළමු වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් මීට අදාළවම අධ්‍යාපන අමාත්‍යාංශයට කළ පැමිණිල්ලට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුම්දීම මත එම මෙම අයගේ ගොනුව අධ්‍යාපන අමාත්‍යාංශයට යොමුකර ඇති බවයි.

**නිරීක්ෂණ හා නිගමනය :-**

කොමිෂන් සභාව විසින් සිදුකරන ලද 2019.06.03 දිනැති විමසුම අනුව ආදි ශිෂ්‍ය පදනමින් 2019 වර්ෂය සඳහා බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයට බඳවාගෙන ඇති සිසු සිසුවියන් 32 ගෙන් ඉහත සඳහන් **OB 62, OB 81, OB 13, OB 41, OB 42 OB 43, OB 21** යටතේ ඇතුළත් කරගෙන ඇති දරුවන්ගේ ලකුණු ලබා දීම නිවැරදි නොවන බව අනාවරණය වේ.

මෙම තත්වය කොමිෂන් සභාව විසින් පළමු වගඋත්තර පාර්ශවය වන බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති වෙත පැහැදිලි කර දී ඇත. එහිදී එම පාර්ශවය සඳහන් කර ඇත්තේ, මේ වන විට චක්‍ර ලේඛ ප්‍රකාරව අවශ්‍ය සිසුන් ප්‍රමාණය පාසලට ඇතුළත් කරගෙන ඇති බවත්, 2019 වර්ෂයට අදාළව ආදි ශිෂ්‍ය පදනමින් ඇතුළත් වූ දරුවෙක් පාසලෙන් ඉවත් වුවහොත් එම පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ සිටින මෙම පැමිණිලි පාර්ශවයගේ දරුවා පාසලට ඇතුළත් කරගත හැකි බවත් චක්‍ර ලේඛය පරිබාහිරව දරුවා ඇතුළත් කර ගැනීමට නම් තමාට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලිඛිත නියෝගයක් ලැබිය යුතු බවත්ය.

මෙම ගණය යටතේ පාසලට ඇතුළත් කරගෙන ඇති කඩඉම් ලකුණු සීමාව 62 කි. පැමිණිලිකරු ලබාගෙන ඇති ලකුණු සංඛ්‍යාව 61 කි. ඉහත ලකුණු ලබාදීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී චක්‍රලේඛ ප්‍රකාරව ලකුණු ලබා දුන්නේ නම් ලකුණු 62 සීමාවට ළඟා වීමට නොහැකි වූ දරුවන්ද මෙම ගණය යටතේ දැනට පාසලට ඇතුළත් වී ඇති බව සනාථ වන බැවින් මෙම පැමිණිලිකරු වෙනස්කමකට භාජණය වී ඇති බවත්, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝණය වීමක් සිදුවී ඇති බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ඉහත නිරීක්ෂණය අනුව පැමිණිලිකරුගේ දියණිය වන ඩී.එම් එවින්දි නිමලිනී දියණියට නීත්‍යානුකූලව අදාළ පාසැලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව නොලැබී ඇති හෙයින් එම දරුවා බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට මෙයින් දන්වා සිටිමි.

02. වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකරුට සිදුවූ අගතිය සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය වෙත රු. 5,000/- ක වන්දි මුදලක් 01 වන වගඋත්තරකරු විසින් ගෙවිය යුතුය.

2019.11.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01 ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/